වගා සහනාධාර චක්‍රලේඛ අංක: 34

මගේ අංකය: සං/ව.ආ/ප්‍රති V
තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ: පෙ. 1474,
කොළඹ 03.
1991.04. දින.

සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අතුරුදහන් වූ හෝ මියගිය අවසර පත්‍ර හිමිකරුවන්
වෙනුවෙන් පසු අයිතිය ප්‍රකාශ කිරීම.

තේ වගා අවසර පත්‍රයන් යටතේ සහනාධාර වාරික මුදල් ලබා අවසන්වීමට ප්‍රථම අතුරුදහන් වූ හෝ මියගිය අවසර පත්‍ර හිමිකරුවෙකු වෙනුවෙන් පසු අයිතිය ලබන තැනැත්තා/ තැනැත්තන් විසින් ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීම පිණිස ඉල්ලුම් කිරීමේදී මේ සමග අමුණා ඇති සී 12 ආකෘතිය මගින් දිවුරුම් ප්‍රකාශයක් ලබාගෙන පසු අයිතිකරුට හෝ පසු අයිතිකරු වශයෙන් නම් කරනු ලබන්නා හට අවසර දීමට පුළුවන.

නීති කෙටුම්පත් සම්පාදකගේ උපදෙස් මත මෙම ක්‍රමය සකස් කරන ලද අතර 1991.03.14 දිනැති ප්‍රාදේශීය කළමනාකරුගේ රැස්වීමේදී මෙය අනුමත කරන ලද බවද දන්වමි.

(ආචාර්ය සරත් බී. මනන්වත්ත)
සභාපති.

පිටපත්:
1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති, මුදල්, සංවර්ධන)
2. සහකාර සාමාන්‍යාධිකාරී (පාලන/පිරිස්)
3. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
4. ක්ෂේත්‍ර සහායකයින්
5. අභ්‍යන්තර විගණක.

සපී/08

43557

101A

ආකෘති අංකය: සී - 12

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අතුරුදහන්වූ හෝ මියගිය අවසරපත්‍ර හිමිකරුවන් වෙනුවෙන් පසු
අයිතිය ප්‍රකාශ කිරීම.

තේ වගා අවසර පත්‍රයක් යටතේ සහනාධාර වාරික මුදල් ලබා අවසන්වීමට ප්‍රථම අතුරුදහන්වූ හෝ මියගිය අවසරපත්‍ර හිමිකරුවකු වෙනුවෙන් පසු අයිතිය ලබන තැනැත්තා/*තැනැත්තන් විසින් ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීම පිණිස කරනු ලබන දිවුරුම් ප්‍රකාශයයි.

(1). ඉඩමේ නම :

(2). අවසර පත්‍ර අංකය :

(3). අවසර පත්‍රය හිමිකරුගේ නම :

(4). අතුරුදහන්වීම/*මියයාම පිළිබඳව ඉදිරිපත් කරනු ලබන සහතිකය :
(අතුරුදහන්වීමක දී ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් සහතික කරන ලද වාර්තාවක් හෝ පැමිණිලි පිටපතක් ද, මියයාමක දී මරණ සහතිකය හෝ එහි සහතික කළ පිටපතක්ද මෙයට ඇමිණිය යුතුය.)

(5). පසු අයිතිය ලබන්නන්ගේ සියලු දෙනාගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් :

| | නම | අයිතිකරුට ඇති සම්බන්ධතාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| 1. | ................ | ................ | ................ |
| 2. | ................ | ................ | ................ |
| 3. | ................ | ................ | ................ |
| 4. | ................ | ................ | ................ |
| 5. | ................ | ................ | ................ |

(6). අංක 576/18 සහ 1989.09.22 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් 1989 කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (තේ වගා කිරීමේ) සහනාධාර නියෝග සහ එකී කලින් කල කරනු ලබන සංශෝධන පරිදි ඉහත සඳහන් අවසර පත්‍රය හිමිකරු අතුරුදහන්වීම/*මියයාම නිසා එම ඉඩමේ පසු අයිතිකරු/*අයිතිකරුවන් සියලු දෙනා වන මම/*අපි, එම අවසර පත්‍රය යටතේ තේ වගා කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් දෙනු ලබන සහනාධාර මුදල් ඉල්ලුම් කිරීම, මුදල් ගනුදෙනු කිරීම සහ ඒ පිළිබඳ ලිපි ගනුදෙනු කිරීම ඇතුළු සියලුම කටයුතු සඳහා පූර්ණ බලය ඇති බවත්, මාගේ/*අපගේ අනුයෝජිත ලෙස ..................................................
........................................ හි පදිංචි ........................
........................................ මහතා/මහත්මිය/මෙනෙවියට මෙයින් බලය පවරන බවත් මෙයින් දන්වමි/*දන්වමු.

(7). තවද ඉහත දී ඇති බලතල පරිදි එම අනුයෝජිත විසින් කරන කවර කටයුත්තක් වුවද මා/*අප විසින් කරන ලද කටයුත්තක් ලෙස සලකා වගකීම් භාර ගනිමි/*ගනිමු. අධිකාරිය විසින් වරින් වර මෙම බලතල යටතේ එම අනුයෝජිතයාට ගෙවන සියලුම මුදල් මට/*අපට ගෙවූ මුදල් සේ සලකන අතර, වැඩ අතපසු කිරීමෙන් හෝ වෙනත් අයුරකින් අධිකාරිය නිකුත් කරන අවසර පත්‍රය යටතේ ආපසු ගෙවීමට ඇති මුදල් මෙම අනුයෝජිතයා නොගෙවන අවස්ථාවක් වුවහොත් එම මුදල් සම්පූර්ණයෙන්ම ගෙවීමටද එකඟ වෙමි/*වෙමු.

(8) මෙම පත් කිරීම අවලංගු කිරීමට අවශ්‍ය වූ විට, ඒ පිළිබඳව අධිකාරියට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් කළයුතු බවත්, එම අවලංගු කිරීම වලංගු වන්නේ නුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එම අවලංගු කිරීම් දැන්වීම පිළිගත් බවට කරන ලද ලිඛිත දැන්වීමකින් පසුව බවත් මින් පිළිගනිමි/*ගනිමු.

<u>අයිතිකරුවන්ගේ නම/*නම්</u>

1. ..............................
2. ..............................
3. ..............................
4. ..............................
5. ..............................

<u>අයිතිකරුවන්ගේ අත්සන/*අත්සන්</u>

..............................
..............................
..............................
..............................
..............................

(9) අතුරුදහන්වූ අයිතිකරුවකු විසින් මෙම අවසර පත්‍රය යටතේ ගෙවීම් අවසන් කිරීමට පළමුව නැවත ඉදිරිපත් වුවහොත් මෙය අහෝසිවන අතර ඉන්පසු කරනු ලබන ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් ගෙවීම් ලැබීම සඳහා ඔහුට බලය ඇත.

(10) ඉහත සඳහන් ඉඩමේ අයිතිකරු/*අයිතිකරුවන් වශයෙන් එහි නම/*නම් සඳහන් අය විසින් ඉහත දැක්වෙන ප්‍රකාශය කියවා බලා 19 .................. දින මා ඉදිරිපිට අත්සන් කරන ලදී.

..............................
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව

සහතික කරන්නාගේ තනතුර: ..............

(මෙම ප්‍රකාශය ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයෙකු හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු, ඕනෑම විනිශ්චයකාරවරයෙකු හෝ මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ කර ඔහු විසින් සහතික කල යුතුය.)

සාක්ෂි :

1. අත්සන :
නම :
ලිපිනය :
ස්ථානය :
දිනය :

2. අත්සන :
නම :
ලිපිනය :
ස්ථානය :
දිනය :

සටහන් : 1. මෙම ආකෘතිය සම්පූර්ණයෙන්ම පිරවිය යුතුය. යම්කිසි කරුණක් අදාළ නොවේ නම් ඒ බව සඳහන් කල යුතුය.
2. * අදාල නොවන වචන කපා හරින්න.

| | |
|---|---|
| අවවාදයයි : | ව්‍යාජ දිවුරුම් ප්‍රකාශයක් සැපයීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ සිර දඬුවම් ලැබිය හැකි වරදකි. |